## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2016

--------------------------------------------

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (මණ්ඩලය) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI – 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රී. ලං.ගි.ප්‍ර./ ශ්‍රී. ලං.මු.වා.ප්‍ර.) අනුකූල වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 - මූල්‍ය ප්‍රකාශන** ඉදිරිපත් කිරීම :- ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව, මණ්ඩලය විසින්, මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට අදාළ වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. කෙසේ වුවද, සමුච්චිත අරමුදලින් ඍජුව අඩුකරන ලද, මහා ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැළසීම වෙනුවෙන් දරන ලද වියදම් ආශ්‍රිත ගිණුම්කරණ ප්‍රතිපත්ති, ස්වභාවය සහ තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.10 - වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයට පසුව ඇතිවන සිදුවීම් :-** මූල්‍ය ප්‍රකාශන බලාත්මක වන දිනයට පසුව ඇතිවන සිදුවීම් එමගින් නිරූපණය නොවන බැවින් එම මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන් විසින් එම මූල්‍ය ප්‍රකාශන බලාත්මක වන දිනය පිලිබඳ දැනුවත් වීම පිණිස මණ්ඩලය විසින් එම මූල්‍ය ප්‍රකාශන බලාත්මක වන දිනය සහ ඒ සඳහා බලය දුන් පාර්ශව සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතුය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන බලාත්මක වන දිනය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 - දේපල, පිරියත හා උපකරණ** :- ප්‍රමිතියේ ඡේද අංක 55 ප්‍රකාරව වත්කමක ක්ෂය වීම එය භාවිතයට ගත් අවස්ථාවෙහි සිට ආරම්භ වන අතර වත්කම අපහරණය කරන දිනයට පෙර දිනයේදී අවසන් වේ. ඊට පටහැනිව, මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා ලද වර්ෂයේදී ක්ෂය කර නොතිබුණු අතර අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි.

(ඈ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.19 -සේවක ප්‍රතිලාභ**:- අනාගත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීම සඳහා වෙනම සැළැස්මක් ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, ජංගම වත්කම් යටතේ වූ භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් (REPOs)වල ආයෝජන විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීම සඳහා යොදාගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී එළඹෙන ලද බදු ගිවිසුම වෙනුවට පසුගිය බදු ගිවිසුම පදනම් කරගෙන කුලී ආදායම ගණනය කිරීම හේතුවෙන් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 25 වන මහල සඳහා වූ කුලී ආදායම රු. 3,882, 144 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් 2016 නොවැම්බර් මාසය සඳහා වූ පොළී අවිනිශ්චිත ගිණුම සහ කල්බදු පදනමින් ගත් වාහන සඳහා පොළී ගිණුම අතර රු..222,150 ක වෙනසක් නිරීක්ෂණය විය,

(ඇ) ලැබිය යුතු ලෙස පෙර වර්ෂයේදී ගිණුම්ගත නොකරන ලද 2015 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලට අදාළව ලද කාර්යාල කුලිය වූ රු. 6,811,737 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරි ව්‍යවසායයන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ II වන උපලේඛණය පදනම් කරගෙන රු. 209,600,000 ක් වටිනා ඉඩමක් වෙනත් ආයතනයකට පවරා තිබුණි. ඒ මත ලැබිය යුතු රු. 423,360,000 ක වන්දි මුදල අදාල පාර්ශවයන්ගෙන් තහවුරුවක් ලබාගැනීමකින් තොරව වෙනත් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. එබැවින්, වෙනත් ණයගැතියන්ගේ ගිණුමේ ශේෂය රු. 423,360,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, ඉඩමේ වටිනාකම සහ වන්දි මුදල අතර වෙනස වූ රු. 213,760,000 මණ්ඩලයේ සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල රු. 213,760,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති ගිණුම් අයිතම හතක සහ විගණනය සඳහා පැවති තොරතුරු උපයෝගී කරගෙන විගණනයේදී ගණනය කරන ලද වටිනාකම අතර එකතුව රු. 92,727,084 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ක්ෂයවීම් ගණනය කිරීමේ උපලේඛනයට අනුව ආකෘතීන් මත වූ ක්ෂයවීම් සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයෙහි 11 වන සටහන අතර රු. 167,900 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 2.3.1 ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාරයන්ගෙන් ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාලවිශ්ලේෂණයට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනයෙන් රු.564,553,943 ක් වූ අතර ඉන් රු. 261,744,375 ක මුදලක් හෙවත් සියයට 46 ක් වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික ගාස්තුව රු.231,271,138 ක් වූ අතර ඉන් රු.142,569,265 ක් හෙවත් සියයට 62 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(iii) හානිකරණය සඳහා ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර වලින් ලැබිය යුතු මුළු මුදලින් සියයට 54 ක් නියෝජනය කර තිබුණි.

(iv) රු.304,664,041 ක් වූ හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනයෙන් රු.256,934,105 ක් හෙවත් සියයට 84 ක් 2016 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද, වසා දැමූ සහ මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය.

(v) සමාලෝචිත වර්ෂය තුලදී වාර්ෂික ගාස්තුවෙන් රු.203,743,845 ක් හෙවත් සියයට 88 ක් හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් රු.181,101,811 ක් හෙවත් සියයට 78 ක් අවලංගු කරන ලද ව්‍යාපෘති 438 කින් වසා දැමුණු ව්‍යාපෘති 180 කින් සහ මෙහෙයුම් අත්හිට වූ ව්‍යාපෘති 83 කින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය.

**2.3.2 වෙනත් ලැබිය යුතු**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු 1,604,200 ක මුදලක් වර්ෂ 6 කට අධික කාලයක සිට හිඟව පැවති අතර එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(ii) වෙනත් ණයගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් හා රු.2,090 ක තොග ඌණතාවයක් වර්ෂ 13 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(iii) 2016 දෙසැම්බර් 31 දිනට රු.490,544,093 ක් වූ වෙනත් මුළු ණයගැතියන්ගෙන් රු.461,040,103 ක් හෙවත් සියයට 94 ක් රජයේ අමාත්‍යාංශ සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. තවද, රජයේ ආයතනවලින් ලැබිය යුතු රු.37,680,103 ක් වසර 4 ට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **ආයතනයේ නම** | **2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල** |
|---|---|
| | රු. |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 37,412,573 |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 141,950 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 125,580 |
| **එකතුව** | **37,680,103** |

(iv) තවද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් රජයේ ආයතන වලින් අයවිය යුතු වසර 4 කට වඩා හිඟව පැවති ශේෂයන් මත මූලා‍ ප්‍රකාශනවල සියයට 100 ක හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.3.3 අයකර ගත නොහැකි සේවක ණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 දෙසැම්බර් 31 දිනට රු.5,671,860 ක් වූ මුළු සේවක ණය ශේෂයෙන් රු.1,403,748 ක් හෙවත් සියයට 25 ක් වසර 4 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ii) වැඩ තහනම් කළ නිලධාරීන් හත් දෙනෙකුගෙන් සහ සේවය අත්හැර ගිය නිලධාරීන් අට දෙනෙකුගෙන් අයකර ගත නොහැකි හිඟ හිටි ණය ශේෂ එකතුව පිළිවෙලින් රු.3,405,344 ක් සහ රු.2,235,299 ක් විය. තවද, අයවිය යුතු ශේෂ අයකර ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන්ගේ කොන්ත්‍රාත් කාලය අවසන් කිරීම, සේවයෙන් ඉල්ලා අස්වීම හා රේඩියෝ අමාත්‍යාංශයට නිදහස් කිරීම හේතුවෙන් ණයශේෂ අය නොවී පැවති අවස්ථා නිරීක්ෂණය විය.

### 2.3.4 ගෙවිය යුතු ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එකතුව රු.8,392,906 ක් වූ විවිධ ණයහිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ii) එකතුව රු.19,809,741 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 16 ට අදාළ රු.5,446,915 ක් හෙවත් සියයට 27 ක් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) 1971 අංක 38 දරන මුදල් පනත** | | |
| (i) | 10 (5) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය විසර්ජනයන්ගෙන් පසුව ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ii) | 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වයද ඇතිව අදාල අමාත්‍යවරයා විසින් ලබාදුන් අනුමැතිය රහිතව 2016 දෙසැම්බර් 31 දිනට රු.4,741,059,094 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 113(3) | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව ආයෝජන මණ්ඩල ව්‍යාපාර වලින් ලැබිය යුතු රු.23,442,740 ක් අත්හැර දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. |
| (ඇ) 2010 දෙසැම්බර් 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 55 | මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල නිරීක්ෂකයෙකු වශයෙන් මහා භාණ්ඩාගාර නියෝජිතයෙකු පත්කර නොතිබුණි. |

## 2.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය අනුව, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් එහි සේවකයන්ට ප්‍රතිලාභ සඳහා ගෙවීම් සිදුකල හැකි වන්නේ ඔවුන්ගේ පාලක මණ්ඩල වල අනුමැතිය සහිතව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් එම ප්‍රතිලාභ විශේෂයෙන් අනුමත කිරීමෙනි. එසේ වුවත්, එවැනි අනුමැතියක් ලබාගැනීමකින් තොරව මණ්ඩලය විසින් එහි සේවකයන් වෙත එකතුව රු.11,627,707 ක් වූ වෘත්තීය, දුෂ්කර හා විශේෂ දීමනා ගෙවා තිබුණි. තවද,1990 දෙසැම්බර් 13 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගැනීමෙන් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රවාහන දීමනා වශයෙන් රු.26,168,541 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

කලක සිට ඉහත චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලයේ සේවකයන් පැමිණීමේ දිරි දීමනා හා ලබා නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් දීමනා යන දෙකම ලබාගෙන තිබුණි. සේවකයන්ගේ පැමිණීම මත පදනම් වූ වර්තමාන දිරි දීමනා යෝජනා ක්‍රමය වෙනුවට විධිමත් දිරිදීමනා ක්‍රමයක් පිළියෙල කිරීම සඳහා 2012 නොවැම්බර් 14 දින පැවති පොදු ව්‍යාපාර කමිටුව විසින් ලබා දුන් නියෝග ප්‍රකාරව, 2013 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පැමිණීමේ දිරි දීමනා යෝජනා ක්‍රමය වෙනුවට ප්‍රධාන කාර්යයසාධන ගෙවීම් යෝජනා ක්‍රමයක් ( Key Performance Payment Scheme) ආදේශ කරන ලදී. මණ්ඩලය විසින් විධිමත් අනුමැතියකින් තොරව 2016 වර්ෂය සඳහා රු.349,375,058 ක් ප්‍රධාන කාර්ය සාධන ( KPP ) දීමනාව ලෙස ගෙවා තිබුණි. තවද, 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය රහිතව දීමනාව ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කර තිබුණි.

(ආ) පී.ඊ.ඩී. 05/2016 දරන 2016 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, අදාල මූල්‍ය වර්ෂය තුල ලාභ උපයන ලද සහ පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් ආකාරයේ දිරි දීමනා ගෙවන හෝ ගෙවා ඇති රජයේ සංස්ථා සඳහා යෝජිත ප්‍රසාද දීමනාව රු.13,500 ක් වේ. කෙසේ වුවත්, ඉහත චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පහහැනිව මණ්ඩලය විසින් ස්ථිර, අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් සඳහා එක් සේවකයෙකුට රු.40,000 ක් බැගින් ප්‍රසාද දීමනා ගෙවා තිබුණු අතර 2016 වර්ෂය සඳහා ඒ අයුරින් රු.48,159,291 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක වන සේවක ණය යෝජනා ක්‍රමය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.768,128,696 ක බදු පූර්ව අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අතිරික්තය රු.407,166,738 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.360,961,958 ක වර්ධනයක් දැක්වුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී අයභාරය සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.391,587,620 කින් සහ රු.103,637,217 කින් වැඩිවීමට ප්‍රතිරූපීව මුළු වියදම රු.135,699,114 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

වියදමෙහි අසාමාන්‍ය වර්ධනය
------------------------------------

සමාලෝචිත වර්ෂය තුල නෛතික සහ වෘත්තීය ගාස්තු රු.40,995,850 ක් වූ අතර උසාවි නඩු සහ ජාත්‍යන්තර බේරුම් කිරීම් සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ වියදම වූ රු.20,484,797 කට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී එය සියයට 100 කින් වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

4.1 කාර්ය සාධනය
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව සකස් කර නොතිබුණි. එබැවින් මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමේ ඵලදායී කාරකයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම යොදාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

(i) ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති වල ප්‍රගතිය
--------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ පහ සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | අවලංගු කරන ලද, වසා දමන ලද හෝ අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|
| 2016 | 182 | 52 | 133 |
| 2015 | 156 | 96 | 111 |
| 2014 | 155 | 100 | 125 |
| 2013 | 146 | 108 | 165 |
| 2012 | 164 | 105 | 114 |
| 2011 | 165 | 103 | 58 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉකුත් වර්ෂ 04 තුලදී මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙහි සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී මේ සම්බන්ධයෙන් සියයට 46 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

- අවලංගු කරන ලද, වසා දමන ලද හෝ අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 2012-2016 කාල පරිච්ඡේදයේ එක් එක් වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවට වඩා විශාල විය.

**(ii) ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන**

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන (FDI) පහත දැක්වේ.

| වර්ෂය | සංයුක්ත සැලැස්ම (2014-2016) අනුව වාර්ෂික ඉලක්කය එ.ජ.ඩො. මිලියන | සත්‍ය ඉටුකර ගැනීම් එ.ජ.ඩො. මිලියන | සත්‍ය ඉටුකර ගැනීම් වාර්ෂික ඉලක්ක වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2016 | 5000 | 801.00 | 16 |
| 2015 | 3500 | 969.66 | 28 |
| 2014 | 2500 | 1616.26 | 65 |
| 2013 | 1391 | 1391.40 | 100 |
| 2012 | 1338 | 1338.16 | 100 |

මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුව, 2016 වර්ෂය සඳහා ඉලක්කගත විදේශ සෘජු ආයෝජන එ.ජ.ඩො. මිලියන 5000 ක් විය. කෙසේ වුවද, මණ්ඩලය විසින් පවත්වන ලද ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණවත් නොවීම සහ රජය විසින් හඳුන්වාදුන් ඵලදායී බදු දිරිදීමනා යෝජනා ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් එ.ජ.ඩො. මිලියන 801 ක් හෙවත් ඉලක්කයෙන් සියයට 16 ක් පමණක් ඉටුකර ගැනීමට මණ්ඩලයට හැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව, මණ්ඩලය විසින් ගිවිසුම්ගත සේවා සඳහා රු.24,215,422 ක් ගෙවා තිබුණි. විස්තර පහත සඳහන් පරිදි වේ.

| ලබාගත් සේවාව පිළිබඳ විස්තර | කාල පරිච්ඡේදය | ගෙවන ලද මුදල |
|---|---|---|
| | | රු. |
| වෙබ් අඩවිය නඩත්තු කිරීමේ සේවාව | 2015 ඔක්තෝබර් 01 සිට 2016 ඔක්තෝබර් 31 දක්වා | 2,825,000 |
| පිරිසිදු කිරීමේ සේවා | 2016 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා | 4,156,200 |
| කාර්ය මණ්ඩලය සඳහා තේ සැපයීම | 2016 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා | 7,338,588 |
| ආරක්ෂක සේවා | 2016 ඔක්තෝබර් 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා | 9,895,634 |
| **එකතුව** | | **24,215,422** |

(ආ) ලිඛිත ගිවිසුම් වලට එළඹීමෙන් තොරව, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.28,826,165 ක් වූ පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි.

(i) වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පොදු අපජලය පිරිපහදු අංගනය වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවෙහි සැළසුම් හා උපදේශන කාර්යය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා පලාපවහන මණ්ඩලය වෙත රු.2,504,096 ක් ගෙවීම.

(ii) පහත සඳහන් පරිදි මණ්ඩලයේ ගොඩනැගිලි, පරිශ්‍ර සහ ගබඩා බාහිර පාර්ශවයන් වෙත එකතුව රු.26,322,069 ක වාර්ෂික කුලී මුදලකට බදු දීම.

| කාර්යය | පාර්ශවය | ගෙවන ලද මුදල |
|---|---|---|
| | | රු. |
| ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ගොඩනැගිල්ලේ 03 වන 04 වන සහ 05 වන මහල් බදු දීම | විදේශ කටයුතු අමාත්‍යාංශය | 18,629,884 |
| අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යාන 04 ක ගබඩා, පරිශ්‍ර සහ ගොඩනැගිලි 12 ක් බදු දීම | පෞද්ගලික පාර්ශව | 7,692,185 |
| **එකතුව** | | **26,322,069** |

(ඇ) සමාගමකට පවරා දෙන ලද බදු දේපල පිළිබඳ හිමිකම් හා අයිතීන් සහ එහි ගොඩනැගිලි හා එම පවරන ලද දේපළවල ස්ථිරව සවි කරන ලද සියලු පිරියත, යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම්, ත්‍රිපාර්ශවීය ගිවිසුම් අත්සන් කිරීම මගින් කිසියම් බැංකුවක හා/හෝ ණය ලබාදෙන ආයතනයක උකස් කිරීම සඳහා මණ්ඩලය විසින් ආයෝජන සමාගම් වලට අවසර ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය පැහැර හැරීමෙන් ඇතැම් සමාගම් ඇවර කිරීම් මඟින් අවසන් වී තිබුණි.

(ii) උකස් කරන ලද දේපළ වලට අදාලව නිරවුල් නොවූ ගැටළු හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම, නිෂ්කාර්ය වන ඉඩම් වල ආවර්තීක පිරිවැය සහ මණ්ඩලයට ලැබිය යුතු මුදල් වලින් අලාභ දැරීමට මණ්ඩලයට සිදුවී තිබුණි.

(ඈ) හොරණ මාපුටුගල පර්ත් වතුයාය සි/ස විද්‍යෝදය ආයුර්වේද වෛද්‍ය විද්‍යාල පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. රු.මිලියන 5 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා එකී දේපල මහජන බැංකුව වෙත උකස් කර තිබුණි.තවද එකී ණය මුදල ලබාගැනීමේදී ත්‍රිපාර්ශවීය ගිවිසුමකට එළඹී නොතිබුණි. ණය මුදල ගෙවීමට අපොහොසත් වීම මත 2013 මැයි 12 දින බැංකුව විසින් දේපල අත්පත් කර ගෙන තිබුණු අතර එය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීරණය කර තිබුණි. බදු දේපල මිලදී ගැනීමට 2014 වර්ෂයේදී නව ආයෝජකයකු ඉදිරිපත් වී තිබුණද, 2017 අප්‍රේල් 15 වන තුරුත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා නව ආයෝජකයා අතර එකගතාවයකට එළඹ නොතිබුණි.

(ඉ) 1999 වර්ෂයේදී මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද පර්ත් වතු යායෙන් කොටසක් 1999 වර්ෂයේ සිට වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ( SLSPC ) භාර දී තිබුණි. පසුව එය 2006 දෙසැම්බර් 08 දක්වා දීර්ඝ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතු යායට අදාලව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දක්වාත් ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(ii) එකතුව රු. මිලියන 12.42 ක් වූ මෝටර් වාහන හා බංගලා කුලිය ජංගම ගිණුම් හරහා කොන්ත්‍රාත් කරුගේ ගිණුමට අවිධිමත්ව මාරුකර තිබුණි.

(iii) මිනුම් වාර්තාවට අනුව, මණ්ඩලය විසින් මිලදී ගත් ඉඩමේ විශාලත්වය අක්කර 1563 ක් සහ පර්චස් 24.74 ක් වුවත්, මණ්ඩලයට අයත් ඉඩමේ විශාලත්වය අක්කර 1435 ක් රූඩ් 3 ක් සහ පර්චස් 25.03 ක් විය. ඒ අනුව අක්කර 127 ක් සහ පර්චස් 39.71 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2012 මාර්තු 22 දිනැති 12/356/504/045 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අධි කාර්මීකකරණ කලාපයක් ඉදිකිරීම සඳහා ත්‍රිකුණාමලය, සාම්පූර්හි පිහිටි අක්කර 818 ක විශාලත්වයකින් යුතු ඉඩමක් මණ්ඩලය වෙත ලබාදීමට අනුමැතිය ලැබී තිබුණි. ඉඩම එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් මණ්ඩලය වෙත නොමිලේ ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) මණ්ඩලය වෙත ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ඉඩම 2015 මැයි 07 දිනැති 1913/19 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කල දැන්වීමක් මඟින් අවලංගු කර තිබුණි.

(ii) ඉඩම අත්පත් කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස 1218 ක් ඉදිකිරීම වෙනුවෙන් මුතුර්හි ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රු.347,130,000 ක් වූ මුදලක් නිදහස් කිරීමට මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2014 අගෝස්තු 01 දින කොටස් මුදලක් ලෙස රු.20,000,000 ක් මුතුර්හි ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මුතුර්හි ප්‍රාදේශීය ලේකම්වරයාගේ 2014 ඔක්තෝබර් 29 දිනැති ලිපිය ප්‍රකාරව, නිවාස 50 ක අත්තිවාරම්

දැමීමේ කාර්යය සම්පූර්ණ කර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු සඳහා රු.3,584,000 ක් වැය කර තිබුණි. මණ්ඩලය විසින් රු. 16,416,000 ක් වූ ඉතිරි මුදල මුතුර්හි ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අයකර ගැනීම සඳහා හෝ ඉදිකිරීම් අඛණ්ඩව කරගෙන යාම සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) ඇඟළුම් කම්හල් පනහ ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අභයපුර ප්‍රදේශයේ අපනයනය සඳහා ඇඟළුම් හා රෙදිපිළි නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 1998 ජූලි 16 දින පෞද්ගලික සමාගමක් මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) වෙන් කරන ලද ඉඩම සඳහා එකවර ගෙවිය යුතු ඉඩම් වාරිකය 2017 මැයි 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ii) සමාගම විසින් භාවිතා කරනු ලබන ඉඩම රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානයක් වශයෙන් ලබාදී තිබුණි. රජයේ ඉඩම් සඳහා වූ විශේෂ ප්‍රදානය අනුව ඉඩමේ ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලය ඊට අනුකූල වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.3.1 අපනයන සැකසුම් කලාප (EPZ), කාර්මික උද්‍යාන (IP) සහ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක කිරීම

අධික පරිපාලන පිරිවැය හේතුවෙන් පහත සඳහන් අපනයන සැකසුම් කලාප සහ ප්‍රාදේශීය කාර්යාල වර්ෂ කිහිපයක් මුළුල්ලේ අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

| සංරචකය | වර්ෂය සඳහා බදු පෙර අතිරික්තය ( ඌණතාවය ) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | (10,903) | (47,108) | (40,781) | (14,050) | (11,775) | (26,980) |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | (9,062) | (3,323) | 777 | (2,969) | (7,767) | (15,743) |
| වයඹ ප්‍රාදේශීය කාර්යාලය | (31,508) | (30,307) | (28,010) | (9,147) | 21,639) | (22,256) |

## 4.4 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ප්‍රවර්ධන කාණ්ඩය යටතේ දරන ලද රු.901,000 ක වියදම් මණ්ඩලයේ අරමුණු සඳහා අදාල වී නොතිබුණි.

(ආ) දේශීය හා විදේශීය වෙළඳපොළ වෙනුවෙන් රේඩියල් ටයර් නිෂ්පාදනය කිරීම සඳහා හොරණ වගවත්ත කාර්මික උද්‍යානයට අයත් අක්කර 100 ක විශාලත්වයෙන් යුතු ඉඩමක් පුද්ගලික සමාගමක් වෙත වෙන්කර දී තිබුණි. ඉඩමෙහි සත්‍ය වෙළඳපොළ අගය සැලකිල්ලට ගැනීමෙන් තොරව රජයේ තක්සේරු කරු විසින් තක්සේරු කරන ලද නාමික අගය පදනම් කරගෙන 99 අවුරුදු බදු පදනමින් අක්කරය රු. 100 බැගින් වාර්ෂික බදු කුලියකට ඉඩම බදු දීමට මණ්ඩලය විසින් සමාගම සමග ගිවිසුමකට එළඹ තිබුණි.

## 4.5 නිෂ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.97,937,000 ක පිරිවැයකට 2004 ජනවාරි 23 දින මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද අක්කර 122 ක් රූඩ් 01 ක් සහ පර්චස් 27.4 ක විශාලත්වයකින් යුතු මලිදූවකන්ද වත්ත නැමැති ඉඩම 2016 දෙසැම්බර් 31 දින දක්වාත් කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

(ආ) පිළිවෙලින් රු.1,958,839 ක් සහ රු.1,917,160 ක් වූ සුනාමි සහන අරමුදල සහ පොදු රාජ්‍ය මණ්ඩල සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ලද අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නොවෙනස්ව පැවතුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෞද්ගලික සමාගමක් ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇඟළුම් කම්හලක් හා වෙනත් රෙදිපිළි නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සහ අපනයනය කිරීමට මණ්ඩලය සමග 1992 අගෝස්තු 14 දින ගිවිසුමකට එළඹුණි. 1992 නොවැම්බර් 05 දින මණ්ඩලය විසින් ගිවිසුම අවසන් කර තිබුණු අතර එකඟ වූ වන්දිය සමග සියළු ගොඩනැගිලි සහ එහි පැවති යන්ත්‍රෝපකරණ මණ්ඩලයට පැවරීමට දන්වා තිබුණි. එකඟ වූ පරිදි වන්දිය ගෙවීමට මණ්ඩලය අපොහොසත් වූ බැවින් එය ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයට යොමු කර තිබුණු අතර සම්පූර්ණ හා අවසන් නිරවුල් කිරීම වශයෙන් රු.23,835,535 ක මුදලක් ගෙවීම සඳහා 2000 අගෝස්තු 07 දින තීන්දුව ලබා දී තිබුණි. එකී මුදල ගෙවීම මත, ව්‍යාපාරය විසින් මණ්ඩලයෙන් තවදුරටත් රු.37,200,000 ක ගෙවීමක් අපේක්ෂාවෙන් බේරුම්කරණ තීන්දුවක් බලාත්මක කිරීමට බේරුම්කරණ පනතේ 31 වන වගන්තිය යටතේ එච්සී/ඒආර්බී/1254/02 දරන ඉල්ලුම් පත්‍රයක් කොළඹ මහාධිකරණයේ ගොනුකර තිබුණි. 2012 මැයි 14 දින මහාධිකරණය විසින් දුන් තීන්දුව ප්‍රකාරව රු.102,138,350 ක අතිරේක මුදලක් ගෙවීමට මණ්ඩලය වගකීමට යටත් විය. මණ්ඩලය විසින් මහාධිකරණ තීරණයට අනුකූල නොවීම හේතුවෙන් වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් රු.102,138,350 ක මුදලක් සඳහා 1431688 අංක දරන බැංකු ගිණුම භාරයට ගැනීමට 2014 දෙසැම්බර් 22 දින නියෝගයක් ලබා දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2015 ජනවාරි 01 දින රු.102,138,350 ක මුදලක් මහාධිකරණයේ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම නඩුව 2017 මැයි 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ආ) මණ්ඩලය විසින් විවිධ විෂමාචාර හේතුවෙන් සේවකයකුගේ සේවය අවසන් කර තිබුණු අතර ඔහු විසින් අවසන් කිරීමේ තීරණයට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොණු කරන ලදී. කම්කරු විනිශ්චය සභාවේ නියෝගය ප්‍රකාරව, වන්දියක් වශයෙන් රු.3,627,900 ක් 2016 අගෝස්තු 22 වන දින කොළඹ කම්කරු විනිශ්චය සභාවේ තැන්පත් කිරීමට මණ්ඩලයට සිදු විය. ඉන්පසු, මණ්ඩලය විසින් කොළඹ කම්කරු විනිශ්චය සභාව දුන් තීන්දුවට එරෙහිව අභියාචනය කර තිබුණු අතර එම නඩුව 2017 මැයි 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

## 4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති

වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පොදු අපජලය පිරිපහදු අංගනය වැඩි දියුණු කිරීමේ යෝජනාව 2009 වර්ෂයේදී ඉදිරිපත් විය. ඒ අනුව, අංගනයේ ධාරිතාවය දිනකට ඝන මීටර් 400 සිට ඝන මීටර් 650 දක්වා වැඩි කිරීමට තීරණය විය. ප්‍රමාණවත් නොවන ධාරිතාවය පිරිපහදු අංගනයේ මනා ක්‍රියාකාරීත්වයට සහ නඩත්තු කටයුතු වලට දැඩිව බලපෑම් කර ඇති බැවින් සහ අංගනයේ පිටවානෙහි පිරිපහදු කළ අපජලයේ ගුණාත්මක ප්‍රමිතිය පවත්වාගැනීමට ඉහල ප්‍රමුඛත්වයක් දිය යුතු බැවින් අපජලය පිටවීමේ ප්‍රමාණය පවත්වාගැනීම සඳහා අංගනයේ ධාරිතාවය ඉහල නැංවීම දැඩිලෙස අත්‍යවශ්‍ය වී ඇති බව අංගනයේ නඩත්තු කටයුතු සිදු කරන සමාගම විසින් 2016 මැයි 14 දින මණ්ඩලය වෙත දැනුම් දී තිබුණි. 2016 අගෝස්තු 03 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි. කෙසේ වෙතත් 2017 මැයි 31 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.8 වෙනත් ආයතන වලට මුදා හරින ලද/ලබාදෙන ලද සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) රේඛීය අමාත්‍යාංශය වෙත මුදා හරින ලද සේවකයන්**

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගොපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති වලට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් තුන් දෙනෙකු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2016 වර්ෂය සඳහා රු.2,465,346 ක මුදලක් වැටුප් හා අතිකාල දීමනා ලෙස වියදම් කර තිබුණි.

**(ආ) මෝටර් වාහන ගාල් කිරීමේ අවසර පත්‍ර**

ලෝක වෙළඳ මධ්‍යස්ථාන පරිශ්‍රයේ මෝටර් වාහන ගාල් කිරීමේ අවසර පත්‍ර 12 ක් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට ලබා දී තිබුණු අතර 2016 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් රු. 720,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද, 2017 මැයි මස අවසානය වන විටත් මෙම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඇ) රු. 3,823,250 ක් පිරිවැය වූ මණ්ඩලයේ ස්ථාවර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

## 4.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ මට්ටමේ තනතුරු අනූ පහක් (95) ඇතුළුව විවිධ වර්ගවල තනතුරු පුරප්පාඩු එකසිය තුනක් (103) 2016 දෙසැම්බර් 31 දින වන විටත් පුරවා නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තථ්‍ය මානව සම්පත් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමකින් තොරව මණ්ඩලය විසින් කොන්ත්‍රාත් හා අනියම් පදනමින් සේවකයන් ගණනාවක් බඳවා ගැනීම හේතුවෙන් කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) හැට තුනක් (63) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයන් එකසිය අසූ අටක් (188) තථ්‍ය සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවතුණි.

(ඇ) කළමනාකරණ සහකාර, පුහුණු සහ නුපුහුණු ප්‍රාථමික මට්ටම යන බාණ්ඩ වල තනතුරු දරන 251 ක සේවක සංඛ්‍යාවක් අතිරික්තව පැවතියද, 2016 වර්ෂය තුළ රු. 58,504,285 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පදනම මත සේවකයින් අසූ දෙකක් (82) ද, අනියම් පදනමින් සේවකයන් දහතුනක් (13) ද බඳවාගෙන තිබුණු අතර 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව, 2014 දෙසැම්බර් මාසයට පෙර බඳවාගත් අනියම් සේවකයින් හතලිස් හය (46) දෙනෙකු 2016 වර්ෂය තුළදී ස්ථිර කාර්යමණ්ඩලයට අන්තර්ග්‍රහණය කර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සඳහා අනුක්‍රමික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) අනුමත සේවක සංඛ්‍යාවට අනුකූලව මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව ඇතැම් විධායක අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.10 මණ්ඩලය විසින් ආරම්භ කර ඇති හා මණ්ඩලයට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග

මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ නඩු 41 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර ඉන් නඩු 35 ක් රු. 15,704,291,016 ක වන්දි හිමිකම් පාමින් මණ්ඩලයට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් ගොනු කර තිබුණු අතර නඩු 6 ක් රු. 6,164,875 ක් වන්දි හිමිකම් පාමින් බාහිර පාර්ශවයන්ට එරෙහිව මණ්ඩලය විසින් ගොනුකර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර තිබුණද, එය මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුකූල වී නොතිබුණි.

## 5.2 අයවැය පාලනය

-------------------

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පාලන ක්ෂේත්‍රයන් | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | පුද්ගල පඩිනඩි පිළිබඳ පාලනය | වෘත්තීය දීමනා, මාසික ප්‍රවහන දීමනා සහ ප්‍රධාන කාර්යසාධන ගෙවීම් වැනි කාර්යමණ්ඩල දීමනා සඳහා මණ්ඩලය විසින් විධිමත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් රැස්කර ගැනීම | ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු හිඟ ශේෂයන් අයකර ගැනීමට මණ්ඩලය විසින් විධිමත් හා ඵලදායී පටිපාටියක් අනුගමනය කර නොතිබුණි. |